# කොවිඩ් 19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිළිබඳව උපදෙස්

පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සඳහා උපදේශ සටහන් ලබා දී ඇත. සංචාරක සේවා, විශාල සාප්පු සංකීර්ණ, උත්සව කළමනාකරණය වැනි සමහර අංශවලට උපදෙස් සටහන් කිහිපයක් අදාළ වේ.

මෙම උපදෙස් කාර්යයන් නැවත ආරම්භ කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සමස්ත අවසරයට යටත් වේ (මුළුමනින්ම / තෝරාගත්).

සෑම උපදෙස් සටහනක්ම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබයි. COVID-19 සම්ප්‍රේෂණය වැළැක්වීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග ආයතන හිමිකරු / වගකිවයුතු පුද්ගලයා වෙත ඉදිරිපත් කර ඇත.

නව ජීවන රටාවක් උදෙසා
புதிய வாழ்க்கை முறையை நோக்கி
TOWARDS A NEW NORMAL

MINISTRY OF HEALTH AND INDIGENOUS MEDICAL SERVICES

World Health Organization

GOVERNMENT MEDICAL OFFICERS ASSOCIATION

SRI JAYAWARDENEPURA KOTTE MUNICIPAL COUNCIL

# 32.සිල්ලර බඩු / කුඩා කඩ

**නිශ්චිත පණිවිඩය / උපදෙස්**

**සංවිධායක / හිමිකරු / සේවා යෝජකයා**

- ඇතුළු වන පුද්ගලයින්ගේ සංඛ්‍යාව පාලනය කළ යුතුය.
- කඩය තුලට එක් වරකට ඇතුලත් කර ගන්නා සංඛ්‍යාව ඇතුලත්වීමේ දොරටුවේ ප්‍රදර්ශනය කළ හැක.
- විකල්පයක් ලෙස ලැයිස්තුවේ ඇති අයිතම පිළියෙළ කොට ලබා දෙන තුරු පාරිභෝගිකයින්ට වෙළඳසැලෙන් පිටත රැඳී සිටින ලෙස ඉල්ලා සිටිය හැකිය.
- කාර්ය මණ්ඩලය පුද්ගලික සනීපාරක්ෂාව පිලිබඳ සැළකිලිමත් විය යුතුය. මුහුණු ආවරණ පැළඳීම, අත් සනීපාරක්ෂාව පවත්වාගෙන යාම, කිවිසුම් යන විට මුඛය සහ නාසය ටිෂු එකකින් හෝ වැලමිටකින් ආවරණය කිරීම සිදු කල යුතුය.
- නිතර අතින් අල්ලන ද්‍රව්‍ය හා මතුපිටවල් (උදා - දොර / ශීතකරණ හැඩල,ප්‍රදර්ශන කවුළු / කවුන්ටර) පිරිසිදු කර විෂබීජහරණය කරන්න.
- හැකිතාක් දොරවල්/ජනෙල් විවෘතව තැබීමෙන් ස්වභාවික වාතාශ්‍රය වැඩි කර ගන්න.
- දොරවල් ඇල්ලීම හැකිතාක් අවම කරන්න. වායුසමීකරණය කර නැත්නම් දොරවල් විවෘතව තබන්න.
- පෙර ඇසුරුම් කිරීම මඟින් එක් එක් පාරිභෝගිකයා සඳහා ගතවන කාලය අවම කල හැක.
- අන්තර්ජාලය/ දුරකථන මගින් ඇනවුම් ලබා ගැනීමේ අවස්ථා වැඩි කල යුතුය. (කුඩා කඩ වල පවා ගනුදෙනුකරුවන්ට අවශ්‍ය බඩු ලැයිස්තු කෙටි පණිවුඩ මගින් ගේනවා ගෙන, ඒවා සකස් කර තැබීමෙන් කඩය තුල ගත කරන කාලය අවම කල හැක).
- ලබා දී ඇති උපදෙස් වලට අනුකූල බව දක්වමින් ඔබ විසින් එකඟතා ප්‍රකාශය පිරවිය යුතුය. සම්පූර්ණ කරන ලද එකගතා ප්‍රකාශයේ මුල් පිටපත ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වෙත යැවිය යුතුය. එහි පිටපතක් අදාළ පළාත් පාලන ආයතනයට (මහ නගර සභාව / නගර සභාව / ප්‍රාදේශීය සභාව) යැවිය යුතු අතර තවත් පිටපතක් තමන් සතුව තබා ගත යුතුය. ඉහත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම හිමිකරු / භාරකරුගේ වගකීම වේ.

**සේවාදායකයා/ පාරිභෝගිකයා**

- මුහුණු ආවරණයක් පැළඳීමට සේවාදායකයින් දිරිමත් කළ යුතුය.
- ශ්වසන ආචාර විධි පිළිපැදීම අපේක්ෂා කරන අතර, අනෙක් අයගෙන් අවම වශයෙන් මීටර 1 ක් වත් භෞතික දුරක් පවත්වා ගැනීම කල යුතුය.
- ඔබ මිලදී ගතයුතු දෑ කලින් තීරණය කරන්න. හැකි නම් ඔබේ බඩු ලැයිස්තුව කලින් කඩයට යවන්න. එමගින් කඩය තුල ගත කරන කාලය අවම වේ. නිතර සාප්පු යාමෙන් වළකින්න.
- හැකිතාක් අන්තර්ජාලය තුලින් ඇනවුම් කිරීම හා අන්තර්ජාලය තුලින් මුදල් ගෙවීමට කටයුතු කරන්න.
- මුදල් පරිහරණය අවම කිරීමට උත්සාහ කරන්න. හැකි සෑම අවස්ථාවකදීම නියමිත මුදලම ලබා දීමට උත්සාහ කරන්න.
- ඔබේ නිවසට ආසන්නතම කඩය වෙත යන්න. වැඩිපුර පරිභෝගිකයන් ගැවසෙන කඩ වලට යාම අවම කරන්න.

**නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වැඩපිළිවෙල**

- වෙළඳසැලේ දොරටුවේ පෝස්ටර් තැබිය යුතුය - මෙමගින් සීමිත සංඛ්‍යාවක් වරකට ඇතුලත් කර ගැනීම, මුහුණු ආවරණ පැළඳීම සහ ශාරීරික දුරස්ථභාවය වැනි පණිවිඩ ලබා දිය යුතුය.




සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.